දෙපාර්තමේන්තු චක්‍රලේක අංක : 01 /2013.

මගේ අංක: එස්ටීපී/පීඑස්/2013,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2013.01.09 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර අධිකාරීන් වෙත.

<u>2012 වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කිරීම සම්බන්ධවයි.</u>

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක : එෆ්අයිඑන්/1051/එෆ්/192/18/ඒබී/ඩී හා 1985.06.18 දිනැති චක්‍රලේඛ ලිපියේ දෙවන (2) ඡේදයට ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. එහි දෙවන ඡේදය අනුව 2012 පාලන වාර්තාව 2013.මාර්තු 01 වන දිනට ප්‍රථම මා විසින් අමාත්‍යාංශයට ඉදිරිපත් කල යුතුව ඇත.

03. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සෑම ආයතනයකින්ම වාර්තා ලබා ගෙන සංඛ්‍යා දත්ත වක්‍රගත කොට වාර්තා සම්පිණ්ඩනය කර දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කලයුතු වේ.

04. එම නිසා ඔබ ආයතනයේ 2012 සංඛ්‍යාලේඛන වාර්තාව 2013 පෙබරවාරි 15 වන දිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන්නට සලස්වන මෙන් දන්වමි.නිවැරදි , පැහැදිලි හා සංසන්දනාත්මක දත්තයන් ඉදිරිපත් කිරීම ඔබගේ වගකීම බව සැලකිය යුතුය.

05. සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කිරීමට අදාල ආකෘතිපත් මේ සමඟ එවා ඇති අතර, එහි පිටපතක් ඔබ කාර්යාලයෙහිද තබාගැනීමට වගබලා ගත යුතුය.

06. 2012 වාර්ෂික සංඛ්‍යාලේඛන දත්ත සටහන් පොත් ලැබුණු බව දන්වන්න.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්